# කිනිතුල්ලාගේ වර්ධක අවස්ථා පෙන්වන ජීවන චක්‍රය




ඇසන්ටෝල්, නෙගුවොන් හෝ නෙගුසාන්ට් වැනි රසායනික කෘමි නාශකයන් යෙදීමෙන් ඔබගේ ගවපට්ටියේ කිණිතුල්ලන් විනාශ කළ හැක.

එය කල යුත්තේ මෙසේය. මෙම රසායනික ද්‍රව්‍ය යෙදීමට පෙර, සතුන් හොඳින් නැවිය යුතුය. ඉන්පසු ශරීරය තරමක් වේලිගිය පසු, ඇසන්ටෝල්, නෙගුවොන් හෝ නෙගුසාන්ට් (මේවායින් මිශ්‍රණය පිළියෙල කරගන්නා අයුරු පැකැට්ටුවල සඳහන් කර ඇත.) මිශ්‍රණය පිළියෙල කරගෙන, එය රෙදි කෑල්ලක පොඟවමින් සතුන්ගේ ශරීරයට යෙදිය යුතුය. මෙසේ කිරීමේදී, සාමාන්‍යයෙන් කිනිතුල්ලන් ගැවසෙන ප්‍රදේශ වන ගාත්‍රා යට කොටස්ද, වල්ගය කෙලවරද, කන් සහ කන් පිටු පසද තෙමීමට විශේෂයෙන් උනන්දු විය යුතුය.

සෑම දෙමාසයකට වරක් මේ අන්දමට කෘමිනාශකය යෙදීමෙන්, ඔබගේ ගව පට්ටියේ කිණිතුල්ලන්ගේ උවදුර මඟහරවා ගත හැක.